KALYĀṆĪ: Journal of the University of Kelaniya, ISSN - 2012-6859, Volume XXXV (Issue I), 2021
DOI: https://doi.org/10.4038/kalyani.v35i1.58

Examining the Development of Zen Buddhist Sources in the East Asian Buddhist Countries

Senior Prof. (Chair) Medawachchiye Dhammajothi Thero
Director, Postgraduate Institute of Pali and Buddhist Studies
University of Kelaniya

ABSTRACT

It must be stated that there are not sufficient sources to study the theory and the practice of Zen Buddhism for the students and the teachers of Sri Lankan universities, who do their studies in Sinhala language. To fulfil this gap to some extent, this research is carried out. This tradition is named as “Dhyana” in Sanskrit, “Chan” in Chinese, “Son” in Korean, and “Zen” in Japanese. Though this is recognized as a tradition that refuses books or scriptures, its great teachers have produced many books which are known as the primary sources of Zen Buddhism.The main subject discussed in these sources is the Buddhist meditation systems which developed as “Zen” Buddhism in the East-Asian countries such as China, Korea and Japan. Thus, these sources were written in Chinese, Korean and Japaneselanguages. One of the main characteristics of these sources is that they try to introduce the path of purification in a simple manner so that the followers can easily practice. This can be seen throughout the Zen Buddhist history, and that knowledge will help the readers to understand how to implement simple Zen Buddhist techniques in their busy day to day life. Hence, the objective of the research is to examine the Zen Buddhist sources and the meditation systems or techniques which are found in them.

Key words: Chan, Son, Zen, meditation

සෙන් බෞද්ධ මූලාශ්‍රය නැගෙනහිර ආසියානු බෞද්ධ රටවල සංවර්ධනය වූ අයුරු විමර්ශනය කිරීම.

හැඳින්වීම

භාවනා නිකාය වශයෙන් හැඳින්වෙන සෙන් බෞද්ධ සම්ප්‍රදාය විසින් ඉදිරිපත් කරනු ලබන දර්ශනය හා චරණය කෘති පිළිබඳව ඉගැන්වෙන සිංහල බසින් අධ්‍යයනය කරන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට, ශිෂ්‍යයන්ට පරිශීලනය කළ හැකි ශාස්ත්‍රීය ලිපි ලේඛන හා ග්‍රන්ථ ඉතාමත් අල්පය. එම ඌණතාව යම්පමණකට හෝ සපුරාලනු වස් මෙම ලිපිය රචනා කරන ලදී. චීන බසින් 'ඡාන්' (Chan) නමින්ද කොරියානු බසින් 'සෝන්' (Sŏn) නමින් ද එසේම ජපන් බසින් 'සෙන්' (Zen) නමින් ද හැඳින්වෙන මෙම දාර්ශනික ඉගැන්වීම් සමුදාය මූලාශ්‍රය ග්‍රන්ථ රචනා කරමින් විවිධ මං ඔස්සේ සංවර්ධනය කරනු ලබනුයේ චීන කොරියන් හා ජපන් යන නැගෙනහිර ආසියානු රටවල බෞද්ධ ආචාර්යවරුන් විසිනි. එහෙයින් එම රටවල බෞද්ධ භාවනා ක්‍රමයේ සිදු වූ අභිවෘධිය මෙම පර්යේෂණය මගින් විමර්ශනය කළ හැකිය. සාමාන්‍යයෙන් ග්‍රන්ථ ප්‍රතික්ෂේප කරන හුදෙක් භාවනාව සඳහාම කැපවුණු සම්ප්‍රදායක් වශයෙන් මෙය ප්‍රචලිත වූවත් ඒ පිළිබඳ වරින් වර එම රටවල රචිත ලේඛන සමූහයක්ම විද්‍යමාන වී තිබීම සුවිශේෂ කරුණකි. එම ලිඛිත මූලාශ්‍රය අධ්‍යයනය කරමින් ඒවායෙහි අන්තර්ගත ඉගැන්වීම් මගින් සෙන් භාවනා ක්‍රමවේදයන්හි සිදුවූ සංවර්ධනය මෙම ලිපියෙන් පරීක්ෂාවට ලක් කෙරේ. සෙන් බෞද්ධ භාවනා සම්ප්‍රදායට අයත් මූලාශ්‍රය ග්‍රන්ථවල කාලය, කර්තෘ හා අන්තර්ගතය පිළිබඳ මනා විශ්ලේෂණයක් මෙම පර්යේෂණය මගින් සිදු කෙරෙන බැවින් පාඨකයාට බෞද්ධ භාවනා ක්‍රමයන් හා ඒවායෙහි ප්‍රවර්ධනයන් ඉගැනීමට ඉඩ ප්‍රස්තාව සැලසෙනු ඇත. විශේෂයෙන්ම චීනය තුළ ආරම්භ වන මෙම භාවනා සම්ප්‍රදායේ චීන සංවර්ධනය හා ජපන් කොරියන් රටවල එහි අභිවර්ධනය මූලාශ්‍රය ඇසුරින් අවබෝධ කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

සෙන් බුදු දහම මීට වසර එක්දහස් පන්සියයකට පමණ පෙර චීනයේ ප්‍රභවය ලැබ සංවර්ධනය වූවකි. ඒ ඓතිහාසික බුද්ධ නමින් හැඳින්වෙන ගෞතම බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර දහසකට පමණ පසුවය. එය චීනයෙන් කොරියාවටත්, ජපානයටත් පසුව වියට්නාමයටත් ව්‍යාප්ත වූයේය. මීට වසර සියයකට පමණ පෙර එය බටහිරට සම්ප්‍රාප්ත විය. ක්‍රි.ව. පළමුවන සියවසේ චීනයට පැමිණෙන මහායාන බුදු දහම චීන සංස්කෘතිය හා මිශ්‍ර වී නව ආකාරයක් ගත්තේය. එහි එක් ප්‍රතිඵලයක් වශයෙන් චීන ඡාන් (Chan) සම්ප්‍රදාය හඳුන්වාදිය හැකිය. පාලි හා සංස්කෘත භාෂා පදනම් කර ගත් සාහිත්‍ය ග්‍රන්ථ තුළ ධ්‍යාන නමින් ද හැඳින්වෙන අතර එම සම්ප්‍රදාය ඉන්දියාවේ උපත ලැබ පසුව චීන, ජපන්, කොරියන් යන නැගෙනහිර ආසියානු රටවල සංවර්ධනය සංකල්පයක් වශයෙන් මත පළ වී තිබුණත් මෙම සම්ප්‍රදාය චීනයේම නිෂ්පාදනයක් බව පැවසිය හැකිය. (ධම්මජෝති හිමි, 2011) ක්‍රි. ව 5 වන සියවසේ දකුණු ඉන්දියාවේ සිට චීනයට පැමිණි බෝධිධර්ම හිමියන් විසින් මෙම භාවනා (Chan) සම්ප්‍රදාය චීනයට හඳුන්වාදුන් බව පිළිගැනේ.

පර්යේෂණ ක්‍රමවේදය

මෙය ග්‍රන්ථ ප්‍රතික්ෂේප කරන සම්ප්‍රදායයක් වශයෙන් පිළිගත්තත්, එහි ආචාර්යවරුන් විසින් අගය කරන ලද හා භාවිත කරන ලද මුල් මහායාන සූත්‍ර ග්‍රන්ථ රාශියක්ම පවතී. එසේම මෙම සම්ප්‍රදායට අයත් පශ්චාත් ආචාර්යවරුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ රාශියකි. එහෙයින් මෙම පර්යේෂණ ලිපියේ මූලික අරමුණ වන්නේ ග්‍රන්ථ ප්‍රතික්ෂේප කරන ලදැයි සැලකෙන මෙම සම්ප්‍රදායට අයත් මූලාශ්‍රය ග්‍රන්ථ පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කිරීමටය. චීනය, කොරියාව, හා ජපානය යන නැගෙනහිර ආසියානු බෞද්ධ රටවල වඩාත් ජනප්‍රිය වූ මෙම භාවනා සම්ප්‍රදාය සතු මුල් මූලාශ්‍රය ග්‍රන්ථ රාශියක් ම එම රටවල භාෂාවන්ගෙන් රචනා වී තිබෙන අතර ඉන් සමහර ඒවා ඉංග්‍රීසි බසට ද පරිවර්තනය කර තිබේ. තවද මෙම මූලාශ්‍රය ග්‍රන්ථ පිළිබඳව නූතන විද්වතුන් විසින් ඉංග්‍රීසි බසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණාත්මක ලිපි

ලේඛනද විද්‍යමාන වේ. එම බොහෝ ලිපි ලේඛන වල විස්තර කෙරෙන්නේ ග්‍රන්ථ එකක් හෝ කිහිපයක් වන අතර මෙම ලිපියෙන් ඡාන් සම්ප්‍රදායට අයත් සමස්ත මුල් මූලාශ්‍රය විස්තරව ඉදිරිපත් කිරීමට උත්සහ කෙරෙනු ඇත. එහිදී බලපාන අභියෝගය වන්නේ එම මුල් මූලාශ්‍රය රචිත පැරණි චීන කොරියානු හා ජපන් යන මුල් භාෂා පිළිබඳව මනා අවබෝධයක් අවශ්‍ය වීමය. චීන භාෂාව පිළිබඳ දැනුමක් මෙහි කතුවරයා සතුව තිබුණත් සෙසු කොරියන් හා ජපන් භාෂාවලින් රචිත කෘති අධ්‍යයනය සඳහා භාවිත කෙරෙනුයේ ඉංග්‍රීසි බසින් ලියන ලද ද්විතීයික මූලාශ්‍රයයි. එසේම ඇතැම් ලේඛන ද මුල් ස්වරූපයෙන් සොයාගැනීමට අපහසු බැවින් ද්වීතීයික මූලාශ්‍රය මත යැපීමට සිදු වේ. එය මෙම පර්යේෂණයේ සීමාවන් වශයෙන් දැක්විය හැකිය.

ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය ග්‍රන්ථ පරිශීලනය කරමින් සෙන් බෞද්ධ ඉගැන්වීම් හා ඒවායේ ඓතිහාසික සංවර්ධනය පර්යේෂණාත්මකව අධ්‍යයනය කිරීම මෙමඟින් සිදු කෙරේ.

මූලාශ්‍රය ඇගයීමක්

බෝධිධර්ම හිමි හා ලංකාවතාර සූත්‍රය

සාම්ප්‍රදායික පිළිගැනීමට අනුව බෝධිධර්ම හිමි ක්‍රි.ව. 5 වන සියවසේ මැද භාගයේ ජීවත්වූ ඉන්දියාවේ පල්ලව ප්‍රදේශයෙන් බිහි වූ, රාජ කුමාරයෙකි. උන් වහන්සේ 27 වන ඡාන් ආචාර්යවරයා වූ ප්‍රඥාතාරාගේ අපවත්වීමෙන් පසු නායකත්වයට පත් වූ බව කියැවේ. ප්‍රඥාතාර, බෝධිධර්ම හිමියන් චීනයට යැවීම සඳහා උනන්දු වූ බව ද කියැවේ. ක්‍රි.ව. 11 වන සියවසේ පමණ රචිත "The Records of the Lamp" නම් කෘතිය වාර්තා කරන අන්දමට බෝධිධර්ම හිමි ක්‍රි.ව. 526 'උඖධි' (Wu-di) නම් රජුගේ රාජ්‍ය සමයේ (547 A.D.) චීනයට පැමිණියහ. (Joseph Edkins 1958) උඖධි අධිරාජයා ථෙරවාද (හීනයාන) භක්තිකයෙකු වීමත් බෝධිධර්ම හිමි මහායානිකයෙකු වීමත් හේතුවෙන් ඔවුන් සම්මුඛව සාකච්ඡා නොකළ බව කියැවේ. එහෙත් තවත් සාම්ප්‍රදායික පිළිගැනීමකට අනුව මේ දෙදෙනා හමුවී ධර්ම සාකච්ඡාවක්

ද පවත්වන ලදී. එහි දී අධිරාජයා විසින් අසන ලද ප්‍රශ්න කීපයෙන් පළමු වැන්න වූයේ තමන් විසින් කරන ලද විහාරාරාමාදි පුණ්‍ය ක්‍රියාවන්හි කොපමණ පින් තිබේ ද? යන්නයි. ඊට බෝධිධර්ම හිමියන්ගේ පිළිතුර වූයේ කිසිදු පිනක් 'නැත' යන්නයි. ඉන් විශ්මයට පත් අධිරාජයා, දෙවන ප්‍රශ්නය වශයෙන් බුදුරජාණන් වහන්සේ සිටිත් ද? නැත්ද? යැයි අසන ලද අතර ඊට පිළිතුර වූයේ ද 'නැත' යන්නයි. බෝධිධර්ම හිමියන්ගේ මෙම පිළිතුරුවල දාර්ශනික අර්ථය වන්නේ ශූන්‍යතා දර්ශනයයි. එමඟින් බලන කල සියල්ල ශූන්‍ය හෙවත් නැත යනුවෙන් පිළිගනු ලැබේ. ඉන් අදහස් කෙරෙන්නේ අප ඇත යනුවෙන් ගන්නා දෙයෙහි ස්වභාවශූන්‍යත්වයයි. එහි ගැඹුරු අර්ථය තේරුම් ගත නොහැකිව ප්‍රකෝප වූ අධිරාජයා බෝධිධර්ම හිමියන් හා සාකච්ඡා කිරීම ප්‍රතික්ෂේප කළ බවත්, ඉන් පසු උන්වහන්සේ දකුණු චීනයේ ගඟ තරණය කොට හර්නන් ප්‍රදේශයට පිටත්ව ගිය බවත් දැක්වේ. හර්නන්හි සැවොලින් ආරාමයට ඉහළින් පිහිටි කන්දක් ආශ්‍රිත ගුහාවක උන්වහන්සේ භාවනානුයෝගීව වසර නවයක් (9) සිටි අතර එම භාවනා ක්‍රමය 'Wall gaze' (Pikuan) හෙවත් 'හිස් බිත්තියක් දෙස බලා භාවනා කිරීම' වශයෙන් ප්‍රකට විය. උන්වහන්සේ ද 'හිස් බිත්තියක් දෙස බලා භාවනා කරන බ්‍රාහ්මණයා' වශයෙන් ප්‍රකට වූහ. හිස් බිත්තියක් දෙස බලා, සිත්හි පවත්නා හැඟීම් මතකයන්, පරිකල්පනයන් හා සිතුවිලි පිරිසිදු කර දැමීම මෙන්ම බාහිර ක්ලේෂයන්ගෙන් සිත ආරක්ෂා කර ගැනීම මෙමගින් සිදු කෙරේ.

බෝධිධර්ම හිමි වැඩ විසූ සැවොලින් ආරාමයට ඉහළින් පිහිටි මෙම ස්ථානය වර්තමානයේ ද මහත් සම්භාවනාවට පාත්‍රව පවතී. මෙම වසර නමයෙන් පසු සෙන්ගුවාන් නම් (487-593 A. D.) චීන භික්ෂුව බොධිධර්ම හිමියන් වෙත පැමිණ හොයික (Huike) නමින් ශිෂ්‍යභාවය ලබා ගනියි. බෝධිධර්ම හිමියන්ගේ අවධානය තමන් වෙත ලබා ගැනීමටත්, තම අවංකභාවය ඔප්පු කිරීමටත් හොයික විසින් තම අත කපා ගත් බව කියැවේ. එසේම තවත් පිළිගැනීමකට අනුව, හොයික එලෙස අත කපා ගනු ලැබුවේ තම අතීත කර්ම නිතර නිතර සිහිපත් වන

බැවින් ඒවා අමතක කර ගැනීමටය. හොයික අතීතයේ දී දක්ෂ සටන්කාමී යුධ සෙබලෙකු වූ අතර සටනේ දී පතිත වූ ලේ පහරක් තම අතෙහි වැදී නොමැකී පැවැතුණු අතර එම ලපය දකින සැම විටම ඔහුට එම ඝාතනයන් සිහිපත් වන්නට වූයේය. බෝධිධර්ම හිමියන් හමු වූ පසු එය අමතක කර දැමීමට අත කපා ඉවත් කර තමන්ට දඬුවම් කර ගත් බව පිළිගැනේ. (Wang Ru Tong 2016)

බෝධිධර්ම හිමියන් විසින් හොයිකට ඉගැන්වූ එක් සූත්‍රයව් වූයේ යෝගාචාර සම්ප්‍රදායේ මූල ග්‍රන්ථයක් වශයෙන් සැලකෙන ලංකාවතාර සූත්‍රයයි. මෙම සූත්‍රයෙන් ඉදිරිපත් කෙරෙන එක් අදහසක් නම් පෞද්ගලික අනුභූතියෙන් සියල්ල අවබෝධ කළ යුතු බවයි. අනුභූතියට මුල් තැන් දීම තුළ වාචික හා ලේඛිත දේවල්හි අවශ්‍යතාව අඩු වන බව පිළිගත හැකිය. එබැවින් ඡාන් සම්ප්‍රදාය භාෂණය හා ලේඛනය පිළිබඳ අඩු අවධානයක් දක්වන්නට ඇතැයි සිතිය හැකිය. එහෙත්, එය සම්පූර්ණයෙන් ම වාචික හා ලිඛිත ග්‍රන්ථ ප්‍රතික්ෂේප කිරීමක් නොවන බව බෝධිධර්ම හිමි විසින්ම හොයිකට ලංකාවතාර සූත්‍රය ඉගැන්වීමෙන් ප්‍රකට කරන ලදී. මහාචාර්ය ටී.ඩී. සුසුකි ලංකාවතාර සූත්‍රය බෝධිධර්ම හිමියන්ට බලපෑ ආකාරය මෙසේ සඳහන් කරයි.

> ''තා ඕ සුවැන් විසින් රචනා කරන ලද චීනයේ ශ්‍රේෂ්ඨ භික්ෂූන්ගේ චරිතාපදාන නම් කෘතීන්ට අනුව බෝධිධර්ම විසින් ලංකාවතාර සූත්‍රය කාණ්ඩ හතරකින් යුක්තව හොයිකට උගන්වන ලදී. බෝධිධර්ම මෙසේ හොයිකට කීය. 'මා විසින් පරීක්ෂා කර බලන ලද ආකාරයට චීනයේ වෙනත් කිසිදු සූත්‍රයක් මෙම ලංකාවතාර සූත්‍රය තරම් ඔබට මඟ පෙන්වන්නේ නැත. එසේම එය ඔබට ලෝකය බේරා ගැනීමට උදව් කරනු ඇත.'' (Suzuki 1999)

ලංකාවතාර සූත්‍රය යෝගාචාර සම්ප්‍රදායේ මෙන්ම ඡාන්

සම්ප්‍රදායේ ද මූල ග්‍රන්ථයක් වශයෙන් සැලකේ. ඡාන් සම්ප්‍රදායයෙහි ලංකාවතාර සූත්‍රයට කොතරම් උසස් තත්වයක් පිරිනැමුණ ද යන්න මුලින් එම සම්ප්‍රදාය ලංකාවතාර සම්ප්‍රදාය (Lengqiejing Zong) යනුවෙන් හැඳින්වීමෙන් ම පැහැදිලිවේ. මෙම සම්ප්‍රදාය හිතට මුල් තැන දුන් ඉගැන්වීම් සමුදායක් පදනම් කර ගත් බැවින් ඒ හා සමානම වූ ලංකාවතාර සූත්‍රය මෙම සම්ප්‍රදාය විසින් අගය කරන්නට ඇත. ලංකාවතාර සූත්‍රයේ මූලික ඉගැන්වීම් දෙකක් නම් 'සියල්ල සිතුවිලි මාත්‍රයක් පමණි' (චිත්තමාත්‍රමෙවෙදං) යන්න හා ස්වයං අවබෝධයයි. (කලුපහන 1987) බාහිර ලොව පවත්නා සියලු දෑ තීරණය කරනු ලබනුයේ අභ්‍යන්තර සිත මගින් බැවින් බාහිර ලොව චිත්ත නිර්මිතයක් වශයෙන් එහි ඉගැන්වේ. එබැවින් සත්‍ය වශයෙන් සලකා බලන විට යථාර්ථ වශයෙන් පවතින්නේ 'සිත පමණි' යන මතය මෙම සූත්‍රය මගින් ඉදිරිපත් කෙරෙයි. බාහිර ලොව තීරණය කිරීමේ දී එය සිදු වන්නේ සිතෙහි පවත්නා කර්මබීජාදියට සාපේක්ෂකවය. එම නිසා සාපේක්ෂක ඥානය ද අශුද්ධය. පරිශුද්ධ වූ ඥානය වශයෙන් ඉගැන්වෙන්නේ මෙම සාපේක්ෂකතාව ඉක්මවූ කර්මාදී බීජ යෝග තුළින් (භාවනාව) ධෝවනය කරන ලද සිතයි. එය පරිනිෂ්පන්න ඥානය හෙවත් යථාභූත ඥානය වශයෙන් ඉදිරිපත් කෙරේ.[ස] එය ස්වයං අවබෝධයෙන් සාක්ෂාත් කළ යුත්තකි. එසේම එය අනුභූතිමය අත්දැකීමකි. අනුභූතියට මුල් තැන දෙමින් සිත පිළිබඳ ඉදිරිපත් කෙරෙන විග්‍රහය නිසා ලංකාවතාර සූත්‍රයෙන් භාෂණයේ හා ලේඛනයේ වැදගත්කම අවම වන බව කල්පනා කළ හැකිය. එහෙත්, බෝධිධර්ම හිමියන් විසින් චීනයේ තම ප්‍රථම ශිෂ්‍යයා වන හොයිකට ලංකාවතාර සූත්‍රය නිර්දේශ කිරීමත්, ඡාන් සම්ප්‍රදාය මුල් යුගයේ ලංකාවතාර සම්ප්‍රදාය නමින් හැඳින්වීමත් යනාදී කරුණු සැලකීමේ දී ඡාන් සම්ප්‍රදායයේ මුල් යුගයේ සම්පූර්ණයෙන් ග්‍රන්ථ ප්‍රතික්ෂේප කිරීමක් නොතිබෙන්නට ඇත. එය පශ්චාත් කාලීන වර්ධනයක් වශයෙන් අනුමාන කළ හැකිය. සමහර විට එය ඡාන් සම්ප්‍රදායයේ ජපන් ස්වරූපය වූ සෙන් සම්ප්‍රදාය විසින් ඉස්මත්තට ගෙනෙන ලද අදහසක් ද විය හැකිය. ඡාන් භාවනාවන්හි නියැලීමේ

අරමුණ අළලා ක්‍රි.ව. එකළොස්වන සියවසේ පමණ රචිත බෝධිධර්ම හිමියන්ට ආරෝපිත එක් කාව්‍යයක මෙසේ දැක්වේ.(Fred Srum 1985)

> ''ග්‍රන්ථවලින් පරිබාහිර සුවිශේෂ සම්ප්‍රදායයකි. එය වචන හෝ අක්ෂර මත පදනම් වී නොමැත. එය ඍජුවම සිත හා සම්බන්ධ වූවකි. කෙනෙකුගේ ස්වයං ස්වභාව දැකීමෙන් බුද්ධ ස්වභාව වෙත ළඟා වීම එහි අරමුණ වේ.''

මෙහි මුල් වාක්‍ය දෙකින් කියැවෙන්නේ ඡාන් යනු 'තියෙන්තැයි' වැනි සම්ප්‍රදායයන්හි මෙන් සූත්‍ර (ග්‍රන්ථ) අවධාරණයක් නොමැති බවය. එසේම හුවායෙන් සම්ප්‍රදායෙහි මෙන් අධිභෞතික මිථ්‍යා ඉගැන්වීම්වලින් හා අසීමිත පුදපූජාවලින් තොර බවයි. අවසාන පද්‍ය ඛණ්ඩ දෙකින් කියැවෙන්නේ ඡාන් තම අභ්‍යන්තර විඥානයෙහි ගවේෂණය කිරීම මගින් බුද්ධ ස්වභාවය සොයා ගැනීමයි. එයට සම්ප්‍රාප්ත වීමයි. බෝධිධර්ම හිමියන් චීනයට පැමිණෙන විට චීන ජනයා විසින් මුහුනදුන් විශාලතම ගැටලුව වූයේ ඉහත සඳහන් සම්ප්‍රදයයන් දෙක මගින් චීන බුදුදහම එක් අතකින් උග්‍ර ශාස්ත්‍රීය වාදයකටත් අනිත් අතින් අසීමිත ආගමික වාදයකටත් තල්ලුකර තිබීමයි. මෙමගින් පීඩාවට පත් චීන ජනතාවට ඉතා සරලව බෞද්ධ ප්‍රතිපදාව අනුගමනය කිරීමට අවශ්‍යව තිබුණේය. එම අවශ්‍යතාව සපුරාලනුවස් බෝධිධර්ම හිමියන් විසින් එම දෙඅංශයම බැහැරවන පරිදි සරල සුගම ක්‍රමවේදයක් වශයෙන් හුදෙක් භාවනා කිරීම අවධාරණය කරන්නට ඇතැයි කල්පනා කළ හැකිය. බෝධිධර්ම හිමියන් විසින් ඇති කරන ලද එම බෞද්ධ ප්‍රතිපදාව පහසු කිරීමේ උත්සහය උන්වහන්සේගේ චීන ශිෂ්‍යයන් වන හොයික, දාඕසු, දාඕෆු හා සොන්චි විසින් ද විවිධ දුෂ්කර නොවූ ක්‍රම හඳුන්වාදෙමින් මෙම සම්ප්‍රදාය පෝෂණය කරනලදි. (Yin Shun 1990)

බෝධිධර්ම හිමියන්ගේ චීන ශිෂ්‍යයන් හතරදෙනා අතර ප්‍රමුඛස්ථානය ලැබෙනුයේ හොයික හා දාඕසු යන දෙදෙනාටය. අනෙක්

දෙදෙනා නම් දාඕපු හා සොන්ග් චීය. හොයික බෝධිධර්ම හිමියන්ගේ අනුප්‍රාප්තිකයා වශයෙන් සැලකේ. එසේම චීන ඡාන් සම්ප්‍රදායේ දෙවෙනි ප්‍රමුඛාචාර්යවරයා වශයෙන් ද පිළිගැනේ. මුලින් දාඕ ආගමික අනුගාමිකයෙකු වූ හොයික පසුව බෝධිධර්ම හිමියන්ගේ ශිෂ්‍යයෙකු බවට පත්වෙයි. හොයික තම මානසික සුවය සොයා බෝධිධර්ම හිමියන් වෙත පැමිණියෙකි. දිනක් බෝධිධර්ම හිමියන් වෙත පැමිණි හොයික මෙසේ කීය. ''මගේ සිතට සහනයක් නොමැත. කරුණාකර මට සැනසීම ලබා දෙන්න''. එවිට බෝධිධර්ම හිමි ''ඔබේ සිත මා වෙත ගෙන එන්න, මම එයට සැනසීම ලබා දෙන්නෙමි'' යි ප්‍රකාශ කළේය. එවිට හොයික ''මම එය සෙව්වෙමි, එහෙත් එය සොයාගත නොහැකි විය''. එවිට බෝධිධර්ම හිමි ''මම එය සැනසීමට පත් කළෙමි'' යි ප්‍රකාශ කළේය. ඉන් පසු හොයික සැනසීමට පත් වූ බව කියැවේ.(Wang Ru Tong 2006) සම්මුති අර්ථයෙන් මෙය සාමාන්‍ය දෙබසක් සේ පෙනී ගියත් මෙහි ප්‍රකාශිත අර්ථය ගැඹුරුය. එනම්, අප සිත යැයි කතාකරන දේ ද එහි අතීත මතකයන් ද සිතුවිලි මාත්‍රයෝය (චිත්තමාත්‍රමෙවෙදං). එය අවබෝධ කළ විට නිරායාශයෙන් ම සැනසිල්ල ළඟා වනු ඇත. සත්‍ය වශයෙන් ඒ කිසිවක් නොපවතින බව වැටහී යාමෙන් අතීත මතකයන් නිසා වද දෙන මානසිකත්වයෙන් මිනිසාට මිදිය හැකිය.

බෝධිධර්ම හිමියන්ගේ චීනයේ දෙවන ශිෂ්‍යයා වශයෙන් සැලකෙන්නේ සෙන්ග් චාන්ය. සෙන් චාන් (590 A.D.) චීනයේ තුන්වන ධ්‍යාන නියායාචාර්යවරයා වේ. මුන්වහන්සේ සම්බන්ධ තොරතුරු එතරම් සුලභ නොවේ. උන්වහන්සේ ස්වයං ප්‍රහාණ ක්‍රමයට මුල් තැන් දුන් කෙනෙකි. එම සුවිශේෂ භාවනා ක්‍රමය චීනයේ 'විකල්ප විරහිත සිත' යනුවෙන් ප්‍රකට වී තිබේ. සිත ඇතුළුව සෑම දෙයකම පවත්නා ශූන්‍යත්වය දැකීම තදින්ම අවධාරණය කොට තිබේ. එතුමන්ට අනුව සිත අනිර්වචනීයය. ශරීරය ශූන්‍යය. ධාතූන් සිහිනයකි. මේ මගින් සිතෙහි පවත්නා ද්වන්ධචරණය ප්‍රහාණය කිරීම අපේක්ෂිතයි. ද්වන්ධචරණයට ගෝචර මනස නිරන්තරයෙන්ම හොඳ නරක වශයෙන් අන්තගාමී නිගමනයන්ට ලක්වන බැවින් ඉන් මිදීම මෙමගින් ඉගැන්වේ.

චීනයේ හතරවන ඡාන් නියායාචාර්යවරයා දාඕ ක්ෂින්ග්ය (580-651 A.D.). උන්වහන්සේගේ ඉගැන්වීම්වල පවත්නා සුවිශේෂත්වය නම්, බුදුරදුන්ගේ නාමය සජ්ඣායනය කිරීමයි. එය චීන භාෂාවෙන් 'නියැන් ෆෝ චාන්' යනුවෙන් හැඳින්වේ. එය සිත හා කය එකට සම්බන්ධ කරමින් කෙරෙන භාවනා ක්‍රමයක් වශයෙන් සැලකේ. එසේම එම ක්‍රමය මඤ්ජු ශ්‍රී බෝධිසත්වයන් විසින් දේශනා කරන ලදැයි සැලකෙන ප්‍රඥාපාරමිතා සූත්‍රයේ ද ඉදිරිපත් කෙරෙන්නකි. (Lai Yong Hai 1984) මෙම ක්‍රමය වර්තමාන ථෙරවාද බෞද්ධ රටවල භාවනා ක්‍රමයක් වශයෙන් භාවිත 'ඉතිපි සො...' ගාථාව සජ්ඣායනය කරමින් නවගුණ වැලක් ගනිමින් කරන භාවනාවට බොහෝ සෙයින් සමාන කළ හැකිය.

පස්වන චාන් ආචාර්යවරයා වශයෙන් සැලකෙන්නේ හුන්ජන්ය (601-674). උන්වහන්සේ දාඕ ක්ෂින්ග් යටතේ තරුණ කාලයේම පුහුණුව ලැබූවෙකි. උන්වහන්සේගේ භාවනා ක්‍රමය 'කන් චින්ග්' හෙවත් 'පාරිශුද්ධත්වය පරීක්ෂා කිරීම' වශයෙන් දැකිය හැකිය. මනසේ සියලු ප්‍රතිබිම්බයන් මකා දමා සියලු දූවිලි ඉවත් කොට ගවේෂණය කිරීමයි. මෙතුමාගේ ඉගැන්වීම්වල සුවිශේෂත්වය නම් ජීවිතයේ එදිනෙදා ක්‍රියාකාරකම් කරමින්ම ඒවා සමගම භාවනාව ප්‍රගුණ කිරීමයි. මෙම චින්තනය හිස් බිත්තියක් දෙස බලා සිටිමින් කරන බෝධිධර්ම හිමියන්ගේ මුල් ඡාන් භාවනා ක්‍රමයට තරමක් වෙනස් වූවක් බව පෙනේ. මෙය එදිනෙදා කාර්ය බහුල ජීවිත ගත කරන පුද්ගලයන්ට ද භාවනාව සරලව කළ හැකි පරිදි සකස් කරන්නට ගත් උත්සාහයක් වශයෙන් පෙන්වාදිය හැකිය. ඒ නිසාම මෙම ක්‍රමය වඩාත් ජනප්‍රිය වන්නට ඇත. ඊට හේතුව භාවනාව හුදෙක් ඒ සඳහාම යොමු වූවන්ට පමණක් නොව සෙසු සාමාන්‍ය ජීවිත ගත කරන්නන්ට ද කළ හැකි දෙයක් වශයෙන් ඉදිරිපත් කිරීම මෙහි අරමුණ වන්නට ඇත. මේ වන විට තවදුරටත් භාවනාව ලිහිල්ව ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව චීන ජන සමාජය තුළ ගොඩනැගෙමින් පවතින්නට ඇත. දීර්ඝ කාලයක, විශාල කැප කිරීමකින් කළ යුතු වූ භාවනාව මේ නිසා වැඩි ආයාසයකින් තොරව ප්‍රායෝගිකව කළ හැකි දෙයක් වශයෙන් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නට ඇත. එය

වර්තමානයේ බොහෝ සෙයින් ම ජනප්‍රිය සතිභාවනා (Mindfullness) ක්‍රමයට සමාන ක්‍රමයක් විය හැකිය.

හොය්නන්ගේ වේදිකා සූත්‍රය

චීන ඡාන් සම්ප්‍රදායේ හයවන ආචාර්යවරයා වන හොයිනන්ග් විසින් ලියන ලද තන්ග් ජින්ග් (*Tang Jing*) හෙවත් වේදිකා සූත්‍රය මෙම සම්ප්‍රදායේ සුවිශේෂතම කෘතිය වශයෙන් හැඳින්වීම නිවැරදිය. බෝධිධර්ම හිමියන් හැරුණු විට මෙම සම්ප්‍රදායේ (චීනය තුළ) ශ්‍රේෂ්ඨතම ආචාර්යවරයා වශයෙන් හොයිනන්ග් හැඳින්වීම වඩාත් උචිත විය හැකිය. උන්වහන්සේ තරමටම උන්වහන්සේගේ වේදිකා සූත්‍ර ග්‍රන්ථය මෙම සම්ප්‍රදාය තුළ සම්භාවනාවට පාත්‍ර වී තිබේ. මෙම වේදිකා සූත්‍රයෙන් චීන ඡාන් සම්ප්‍රදාය නව මාවතකට ගෙන යන බව ප්‍රකාශ කළ හැකිය. ඊට හේතුව මෙතෙක් භාවනාව මතම පදනම් වී තිබුණු බෞද්ධ විමුක්ති මාර්ගය 'ක්ෂණික අවබෝධය' (Sudden Awakening) නමින් නව්‍යතම ක්‍රමයකට ඉදිරිපත් කිරීමයි. (Hong Xiuping සහ Sunyiping 1998)

මෙම චීන 'ක්ෂණික අවබෝධ' ක්‍රමයේ නිර්මාතෘවරයා හොය්නන්ග්ය. හොය්නන්ග්ගේ මෙම නව හඳුන්වාදීමත් සමඟම භාවනාවෙන්ම ක්‍රමානුකූලව අවබෝධය ලැබිය යුතු බව ප්‍රකාශ කළ සෙන්ෂ්‍යු හිමියන් ප්‍රධාන පිරිස ඊට ප්‍රතිපක්ෂ වූහ. උන්වහන්සේලාගේ ක්‍රමවේදය පසුව 'අනුක්‍රමික අවබෝධය' (Gradual Awakening) නමින් ප්‍රකට විය. හොය්නන්ග් හිමියෝ භාවනා කිරීම ප්‍රතික්ෂේප නොකළහ. එහෙත් අවබෝධය ඕනෑම අවස්ථාවක පහළ විය හැකි බව අවධාරණය කළහ. එය හුදෙක් මනසේ පාරිශුද්ධත්වය මගින් පමණක්ම ඇති විය යුත්තක් නොවේ. එය ඕනෑම අවස්ථාවක ඕනෑම ස්ථානයක දී පහළ විය හැක්කකි. මේ නිසා අවබෝධය හෝ ප්‍රඥාව භාවනාව මගින් ලැබෙන්නක් පමණක්ම නොවන බව හොය්නන්ග් හිමියෝ පෙන්වා දුන්හ. (Lai Yong Hai 1999) මෙලෙස මෙතෙක් භාවනාව මතම පදනම් වී තිබුණු ඡාන් බෞද්ධ සම්ප්‍රදායට නව අරුතක් 'ක්ෂණික අවබෝධය'

නමින් හොය්නන්ග් හිමියන් විසින් දායාද කරන ලදී. ඡාන් සම්ප්‍රදායේ මෙම අභිනව පෙරළිය හා තවත් බොහෝ විස්තර හොය්නන්ග්ගේ වේදිකා සූත්‍රයේ වාර්තා වේ. වේදිකා සූත්‍රය හොය්නන්ග් හිමියන්ගේ ස්වයංචරිතාපදානයයි. උන්වහන්සේගේ ජීවිතයේ වැදගත් අවස්ථා ප්‍රකට කරමින් රචිත මෙම ග්‍රන්ථයෙන් ඡාන් (සෙන්) බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ අධ්‍යයනයේ දී වැදගත් වන සූත්‍ර ද්වයක් පිළිබඳ වාර්තා වේ. ඒවා නම් වජ්‍රච්ඡේදිකා ප්‍රඥාපාරමිතා සූත්‍රය හා විමලකීර්ති සූත්‍රයයි.¯

වජ්‍රච්ඡේදිකාව හොය්නන්ග්ට බලපෑ ආකාරය වේදිකා සූත්‍රයේ අවස්ථා කීපයකදීම දක්වා තිබේ. මුලින්ම, හොය්නන්ග් වෙළෙඳපොළෙහි දර විකුණන අවස්ථාවේ දී එය තමන්ට අසන්නට ලැබුණු අයුරු හා අවබෝධය ලැබුණු අයුරු මෙලෙස වේදිකා සූත්‍රයේ සඳහන් කර තිබේ.

> ''... මට තවත් මිනිසෙකු විසින් වජ්‍රච්ඡේදිකා සූත්‍රය සජ්ඣායනය කරනු අසන්නට ලැබුණේය. එය ඇසීමෙන් මාගේ සිත පැහැපත් විය. මට අවබෝධය ලැබුණි.'' (Red Pine, 2000)

එසේම චීන ඡාන් සම්ප්‍රදායේ පස්වන ආචාර්යවරයා වන හුන්ජන් විසින් හයවන ආචාර්යවරයා තෝරා ගැනීමට ඉදිරිපත් කළ පරීක්ෂණයේ දී හොය්නන්ග් විසින් ලියන ලද පිළිතුරු කාව්‍යය වජ්‍රච්ඡේදිකා සූත්‍රයෙහි ඉගැන්වෙන ශූන්‍යතා දර්ශනය මත පදනම් වී තිබෙන බව ප්‍රකාශ කළ හැකිය. එම කාව්‍යය මෙසේය.

> ''සත්‍ය ලෙස බෝ රුකක් නැත
> සත්‍ය ලෙස කැඩපතක් නැත
> සත්‍ය ලෙස ලොව කිසිත් නොපවතී
> කෙලෙස මල පවතී ද?''(Red Pine, 2000)

එසේම පස්වන ආචාර්යවර හුන්ජන් හිමියන් විසින් තමන්ට වජ්‍රච්ඡේදිකා සූත්‍රය විස්තර කළ බවත් එම මොහොතේදී තමන්ට සත්‍ය වහාම අවබෝධ වූ බවත් හොය්නන්ග් වේදිකා සූත්‍රයේ මෙසේ වාර්තා කර තිබේ.

> ''පස්වන ආචාර්යවරයා මා විසින් සත්‍ය තේරුම් ගෙන ඇති බව වටහා ගත්තේය. මධ්‍යම රාත්‍රියෙහි පස්වන ආචාර්යවරයා මා

ශාලාවට කැඳවීය. වජ්‍රච්ඡේදිකා සූත්‍රය මට විස්තර කෙළේය. එය ඇසූ ක්ෂණයෙහිම මට අවබෝධ ඥානය පහළ විය. එම රාත්‍රියෙහි ධර්මය මා වෙත ප්‍රදානය කෙළේය......'' (Red Pine, 2000)

හොය්නන්ග්ගේ වේදිකා සූත්‍රයේ උපුටා දක්වෙන තවත් මූලාශ්‍රයකි, විමලකීර්ති නිර්දේශ සූත්‍රය. ඒ මෙසේය.

> ''...... විමලකීර්ති සූත්‍රය මෙසේ ප්‍රකාශ කරයි. අපි මනසේ නියම ස්වභාව ක්ෂණිකව ආපසු ලබා ගනිමු. ˉයහපත් මිත්‍රයනි, මම හුන්ජන්ගේ ස්ථානයෙහි උන්වහන්සේ විසින් වජ්‍රච්ඡේදිකා සූත්‍රය සජ්ඣායනය කරනු ඇසීමි......'' (Red Pine, 2000)

මේ අනුව හොය්නන්ගේ වේදිකා සූත්‍රයත් එහි සඳහන් වන වජ්‍රච්ඡේදිකාවත්, එසේම විමලකීර්ති නිර්දේශයත් චීන ඡාන් සම්ප්‍රදාය හා ඉගැන්වීම් අධ්‍යයනයෙහි දී වැදගත් වන බව ප්‍රකාශ කළ හැකිය. වජ්‍රච්ජේදකා සූත්‍රය බෞද්ධ භාවනාවේ වැදගක් ක්‍රමවේදයක් වන ශූන්‍යතා භාවනාව හා දර්ශනය ඉදිරිපත් කරන අතර එය මුල් බෞද්ධ සූත්‍රවල ද එක්තරා ප්‍රමාණයකට විවරණය වේ. (ධම්මජෝති. එම්. 2011) පසුකාලීනව එය නාගර්ජුන පාදයන්ගේ මධ්‍යමකකාරිකා ග්‍රන්ථයේ කේන්ද්‍රීය ඉගැන්වීම වේ. (කලුපහන. 2012) වේදිකා සූත්‍රයේ විමලකිර්ති නිර්දේශය ඉදිරිපත් කෙරෙන්නේ එහි ශූන්‍යතා දර්ශනය ඉගැන්වෙන අවස්ථා නිසාය. (Red Pine, 2000)

බි යැන් ලු

චීන ඡාන් සම්ප්‍රදායේ මීළඟට වැදගත් වන සාහිත්‍ය කෘතිය වශයෙන් මෝෂු හිමියන් හා සෙසු ඡාන් ආචාර්යවරුන් විසින් නිර්මාණය කරන ලද පරස්පර කියමන් නැතහොත් සංවාද කියමන් පෙන්වාදිය හැකිය. මෙම ක්‍රමවේදය පශ්චාත් කාලීන ඡාන් සම්ප්‍රදාය තුළ ප්‍රසිද්ධ චරිත බිහි වීමටත්, විවිධ ප්‍රශ්න නැගීම හා පිළිතුරු ක්‍රම බිහිවීමටත් දායක වූයේය. එබඳු කියමන් අන්තර්ගත ප්‍රසිද්ධ ග්‍රන්ථයක් වශයෙන් *The Records of the Transmission of the Lamp* පෙන්වාදිය හැකිය.

මෙම ආචාර්යවරුන් අතර ක්‍රි.ව. 709-788 කාලයේ චීනයේ විසූ

මෝෂ්‍යු හිමියෝ ප්‍රධානත්වයක් උසුලති. සාමාන්‍යයෙන් මෙම කියමන් නිර්මාණය වූ කාලවකවානුව වශයෙන් සැලකෙන්නේ චීන සුංග් රාජ්‍ය සමයයි. එහි කාලය වශයෙන් ක්‍රි.ව. 960-1279 දක්වේ. මෙම සුවිශේෂ කියමන් කුන්ග් අන් (Kung-an) කියමන් වශයෙන් චීනයේ ද, කෝආන් (Koan) කියමන් වශයෙන් ජපානයේ ද ජනප්‍රිය වූයේය. කොරියාවේ ඒවා ගුන්ග්-අන් (Gung-an) නමින් ප්‍රකට විය. චීන ලින්චි සම්ප්‍රදායික ආචාර්යවරයෙකු වූ (ක්‍රි.ව. 1063-1135) යුවැන්උකෝවින් විසින් එබඳු කුන්ග්-අන් කියමන් සියයක් හා ඒවාට විස්තරාර්ථ සහිත අටුවාවක් බී යැන් ලු (*Bi Yan Lu*) නමින් සපයන ලදී.

මීට අමතරව චීන ඣාන් සම්ප්‍රදාය අධ්‍යයනය කිරීමේ දී වැදගත් වන තවත් ග්‍රන්ථ රාශියක් පෙන්වාදිය හැකිය. සමහර විට ඒවා ඣාන් දර්ශනය හා ඍජු සම්බන්ධයක් නොමැති විය හැකිය. එහෙත් එම සම්ප්‍රදායේ ඉතිහාසය ගැන තොරතුරු සෙවීමේදී ඒවා වැදගත් මූලාශ්‍රයෝ වෙති. එබඳු මූලාශ්‍රය වශයෙන් පහත සඳහන් ග්‍රන්ථ හා පද්‍ය පෙන්වාදිය හැකිය.

1. *Sutra of the Great Brahman King's Questioning Buddha to Dispel Doubt* (සැක දුරු කර ගැනීම සඳහා මහාබ්‍රහ්ම රාජයා විසින් බුදුරදුන්ගෙන් අසන ලද ප්‍රශ්න) නම් ග්‍රන්ථය.
2. තාවෝ චුවැන් විසින් රචිත හිච්චු චුවැන්හි එන සමහර චීන ශ්‍රේෂ්ඨ භික්ෂූන්ගේ චරිතාපදාන
3. තුංග්හුවාන්හි සොයාගත් සමහර අත්පිටපත්

මෙම මුලින්ම දක්වෙන කෘතියෙන් ප්‍රකාශ කෙරෙන්නේ ඣාන් සම්ප්‍රදායේ ආරම්භය පිළිබඳවයි. එමඟින් ගෞතම බුදුරජාණන් වහන්සේ හා මෙම සම්ප්‍රදාය සම්බන්ධ කිරීමට ගන්නා උත්සාහයක් පිළිබිඹු කෙරේ. එම පුරාවෘත්තය මෙසේය.

> ''එක් සමයෙක බුදුරජාණන් වහන්සේ ගෘද්ධ්‍රකූට පර්වතයෙහි, පරිනිර්වාණයට ආසන්නව වාසය කරන කල්හි භික්ෂු සංඝයා ආමන්ත්‍රණය කිරීමට සිතූ සේක. උන්වහන්සේ අතින් නෙළුම් මලක් ගෙන දැස් දල්වූ සේක. රැස්ව සිටි භික්ෂු සංඝයාට

බුදුරජාණන් වහන්සේගේ මෙම අභිනය තේරුම් ගත නොහැකි විය. නමුත් උන්වහන්සේලා අතර සිටි එක් භික්ෂුවකට එය තේරුම්ගත හැකි විය. ඒ මහාකාශ්‍යප මහතෙරුන් වහන්සේය. උන්වහන්සේ තමන් බුදුරදුන්ගේ අභිනය තේරුම් ගත් බව ප්‍රකාශ වෙන සේ මඳ සිනා පහළ කළ සේක. එවිට බුදුරජාණන් වහන්සේ ද මහාකාශ්‍යප තෙරුන් දෙස බලා' 'සත්‍ය වූ ධර්ම රත්නය ද, එසේම මානසික ශාන්තිය වූ නිර්වාණය ද මට ඇත. එය අක්ෂර මත පදනම් වූවක් නොවන අතර එය ලේඛනයෙන් පරිබාහිර වූවකි. මේ මොහොතේ මම එය මහා කාශ්‍යප තෙරුන්ට ප්‍රදානය කරමි' යි ප්‍රකාශ කළ සේක.'' (Donald H Bishop 2001)

මෙම පුරාවෘත්තය *'Sutra of the Great Brahman King's Questioning Buddha to Dispel Doubt*" (සැක දුරු කිරීම සඳහා මහාබ්‍රහ්මයා විසින් බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්න නමැති සූත්‍රය) නමින් වාර්තා වේ. මෙම සූත්‍රයේ මුල් පිටපතක් පාලි, සංස්කෘත හෝ වෙනත් මූල භාෂාවකින් විද්‍යමාන නොවේ. මෙම පුරාවෘත්තය චීනයේ සොන්ග් රාජ්‍ය සමයේ විසූ එක්තරා විද්වතකු විසින් නිර්මාණය කරන ලද්දක් බව කියැවේ. එම යුගයේ රාජකීය පුස්තකාලයේ එබඳු ලියවිල්ලක් තිබුණු බවත් සොන්ග් රාජ්‍ය සමයේ විසූ අමාත්‍යවරයෙකු වූ (1068-1085) සෙන්ග් සොන්ග් එය දුටු බවත් දැක්වේ. මෙම වාර්තාව ඉහත පුරාවෘත්තයට පදනමක් සපයනු වස් පසුව රචනා කෙරුණක් විය හැකිය. මෙම පුරාවෘත්තය චීන ඡාන් නිකාය ඉන්දියාවේ ධ්‍යාන සම්ප්‍රදායට ඍජු සම්බන්ධයක් නොමැති අයුරින් නිර්මාණය කර තිබේ. චීන ඡාන්හි සුවිශේෂ අංගය වන්නේ එය සියලු ආකාර ලේඛන හා භාෂණවලින් වියුක්ත වූවක් වශයෙන් ඉදිරිපත් කිරීමයි. ඉහත සඳහන් කළ පුරාවෘත්තයට මෙන්ම කරුණුවලට අනුව ඡාන් හෙවත් ධ්‍යාන ඉන්දීය සම්භවයක් පෙන්නුම් කළත් චීන ඡාන් සම්ප්‍රදාය ඒවායෙන් වෙනස් මගක් ගන්නා අයුරු ප්‍රකටය. එබඳු වෙනස්කම් නිසාම එය චීන ප්‍රභවයක් සහිත සම්ප්‍රදායක් වශයෙන් දැක්වීම සාවද්‍ය නොවේ. එය ඉන්දියානු බෞද්ධ

ධ්‍යාන හෝ භාවනා ක්‍රමයන්හිම පශ්චාත් සංවර්ධනයක් වශයෙන් දැක්වීම උචිත නොවන්නේ මේ නිසා විය හැකිය.

ඉහත පුරාවෘත්තයට අනුව ඡාන් සම්ප්‍රදායේ ආරම්භය ගෞතම බුදුහිමියන් තෙක් ඈතට දිව යන්නකි. ගෞතම බුදුරජාණන් වහන්සේ විසින්ම ඡාන් දේශනා කරනු ලැබූවත් එහි ආරම්භකයා වශයෙන් සලකනු ලබනුයේ මහාකාශ්‍යප මහතෙරුන්ය. මහාකාශ්‍යප මහතෙරුන්ගේ භාවනානුයෝගී ජීවිතය මෙන්ම බුදුරජාණන්වහන්සේ හා චීවර හුවමාරු කර ගැනීමේ සිදුවීමාදිය මේ සඳහා උපස්තම්භක වන්නට ඇතැයි සිතිය හැකිය. ඉන් පසු අනුපිළිවෙළින් ඡාන් සම්ප්‍රදායේ පූර්වාචාර්යවරුන් වශයෙන් ආනන්ද, සානකවාස, උපගුප්ත, දෛතික, මික්කක, වසුමිත්‍ර, බුද්ධනන්ද, බුද්ධමිත්‍ර, පාර්ශ්ව, පුණ්‍යයශස්, අශ්වඝෝෂ, කබිමාර, නාගාර්ජුන, ආර්යදේව, රාහුලාත, සංඝනන්දී, සංඝයශ, කාමාරාත, ජයත, වසුබන්ධු, මනෝහිත, හැක්ලේන, ආර්යසිංහ, වශෛෂිත, පුණ්‍යමිත්‍ර, ප්‍රඥාතාරා, බෝධිධර්ම යන පූර්වාචාරීන් දැක්වේ. ඉහත සඳහන් පූර්වාචාරීන් අතර විසිඅටවැනියා වශයෙන් බෝධිධර්ම හිමියෝ සැලකෙති. එහෙත් චීන ඡාන් සම්ප්‍රදායේ නියමුවා වශයෙන් බෝධිධර්ම හිමි ගැනෙන්නේය. (Nanaponika, 2012)

හිච්චුනි චුවැන් හා හිච්චු චුවැන් යනුවෙන් චීනයේ සුප්‍රකට ග්‍රන්ථ ද්වයක් විද්‍යමාන වේ. ඒවා (චීන) භික්ෂුණීන්ගේ චරිතාපදාන හා (චීන) භික්ෂූන්ගේ චරිතාපදාන නමින් පරිවර්තනය කර තිබේ. චීනයේ විසූ වැදගත් භික්ෂුණීන් වහන්සේලාගේ චරිත හා භික්ෂූන් වහන්සේලාගේ චරිත මෙම කෘති දෙකින් ඉදිරිපත් කෙරේ. හිච්චු චුවැන් කෘතියේ බෝධිධර්ම හිමියන්ගේ චරිතාපදානය මෙම ඡාන් බෞද්ධ සම්ප්‍රදාය අධ්‍යයනයේ දී වටිනා තොරතුරු රාශියක් ඉදිරිපත් කෙරේ. බෝධිධර්ම හිමියන් හා හොයික අතර සිදු වූ සංවාදය එහි වාර්තා කර තිබේ. (බලන්න පිටුව 05) හොයිනන්ග් ආදි තවත් මෙම ඡාන් සම්ප්‍රදාය ආලෝකවත් කළ චීන ශ්‍රේෂ්ඨ භික්ෂූන් වහන්සේලාගේ චරිතාපදාන එහි අන්තර්ගත වේ. (Wang Ru Tong, 2006)

කොරියානු සෝන් බෞද්ධ මූලාශ්‍රය

ක්‍රි.ව. 4 වන සියවසේ උතුරු චීන අධිරාජයා විසින් සුන්තා ඕ (Shun-tao) නම් චීන බෞද්ධ භික්ෂුව තවත් පිරිසක් සමඟ කොරියාවේ කොගුර්යෝ පාලකයා වූ සොසුරිම් (Sosurim) රජතුමාගේ කාලයේ කොරියාවට යවන ලදී. සුන්තා ඕ විසින් බෞද්ධ පොත්පත් හා පිළිම රාශියක් කොරියාවට ගෙන යන ලදී. ඉන් පසු ක්‍රමයෙන් කොරියාවේ සෙසු රාජධානි දෙක වූ පේක්චේ (Packche) හා සිල්ලා රාජ්‍යයන් වෙත ද බුදු දහම ව්‍යාප්ත වූයේය. චීනයේ විවිධ බෞද්ධ සම්ප්‍රදායන් කොරියාව පුරා ව්‍යාප්ත වීමෙන් කොරියානු බුදු සමය පෝෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංඝ සමාජය තුළ භේදභින්නතා ඇති වූයේය. එසේම කොරියානු බුදු සමය මූලික වශයෙන් ප්‍රධාන ප්‍රවණතා දෙකක් මත පදනම් වූයේය. ඒ නම් තියෙන්තැයි සම්ප්‍රදාය ප්‍රධාන කර ගත් ශාස්ත්‍රීය අධ්‍යයනය අවධාරණය කළ පිරිස හා භාවනාව තදින් අවධාරණය කළ සෝන් (Sōn) සම්ප්‍රදායික පිරිස වශයෙනි. චීනයේ ඡාන් යනුවෙන් හැඳින්වූ සම්ප්‍රදාය කොරියාවේ සෝන් (Sōn) නමින් හැඳින්වූයේය. මෙම අංශ ද්වයක පිරිස ඒකරාශී කිරීමට ගන්නා ප්‍රයත්නය කොරියානු බෞද්ධ ඉතිහාසය පුරා දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි. ඒ සඳහා වරින් වර පහළ වූ ශ්‍රේෂ්ඨ භික්ෂූන් වහන්සේලා ක්‍රියාත්මක වූහ. උන්වහන්සේලා අතර එක් සුප්‍රකට භික්ෂුවක් වශයෙන් ඌයිඡෝන් (Ūichŏn) හිමියන් සඳහන් කළ හැකිය. උන්වහන්සේ මෙම ප්‍රධාන ප්‍රවාහයන් දෙක එකමුතු කිරීමට දැරූ උත්සාහය උන්වහන්සේ විසින් ම රචිත *Kang Wongak Kyŏng Palsa, Intaegak Kuksa Munji*, p. 3, 4-5 යන කෘතියෙහි මෙසේ සඳහන් කිරීමෙන් පෙනේ.

> ''ධර්මය ආකාර විරහිත අනිර්වචනීය වුවත් ඒවා පෙනුමෙන් හා වචනවලින් විනිර්මුක්ත නොවේ. වචන ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔබ මිථ්‍යාදෘෂ්ටියට හා ක්ලේශ බන්ධනයට හසුවන්නේය. වචනවලට හසු වුවහොත් ඔබට සහන සොයාගත නොහැකිය. .... සූත්‍ර අධ්‍යයනය කරන්නෝ නිතරම අභ්‍යන්තර සංවර්ධනය නොසලකා බාහිර දේවල් කෙරෙහි හඹායති. සෝන් (ධ්‍යාන)

අනුගාමිකයෝ ලෝකයට උදව් කිරීම ප්‍රතික්ෂේප කරන අතර, තම ආධ්‍යාත්මික විමුක්තිය සඳහා වූ භාවනාව කෙරෙහි පමණක් අවධානය යොමු කරති. එම නිසා මෙම දෙපිරිසම අන්තවාදී පක්ෂග්‍රාහීහුය.'' (Donald W. Mitchel, 2002)

උයිඡෝන් හිමියෝ මෙම කණ්ඩායම් දෙකට ම එනම් ධර්ම ග්‍රන්ථ (සූත්‍ර) අධ්‍යයනය මගින් බුද්ධත්‍වාවබෝධය පිණිස ක්‍රියා කරන පිරිසට මෙන්ම භාවනාව තුළින් පරමාර්ථ සාධනය කිරීමෙහිලා නියුතු පිරිසට විරුද්ධ වූහ. උන්වහන්සේ විසින් ඉගෙන ගන්නා ලද තියෙන්තැයි (Tiantai) සම්ප්‍රදාය කොරියාවේ ඡෝන්තාඑ (Chŏntae) නමින් ප්‍රකට වූ අතර එය සාම්ප්‍රදායික ධර්ම ශාස්ත්‍රීය අධ්‍යයනයට මුල් තැන දුන්නේය. එය සෝන් භාවනා සම්ප්‍රදාය හා සම්මිශ්‍රණය කර විමුක්ති සාධනය ඉදිරිපත් කිරීමට ගන්නා උත්සාහය ඉහත ප්‍රකාශයෙන් ප්‍රකට වේ. එහෙයින් උයිඡෝන් හිමියන් විසින් රචිත එම ග්‍රන්ථය කොරියානු සෝන් බෞද්ධ සාහිත්‍යය අධ්‍යයනයේ දී වැදගත් කෘතියක් වශයෙන් සඳහන් කිරීමට පුළුවන.

කොරියානු සෝන් බෞද්ධ ඉගැන්වීම් හා සම්ප්‍රදාය අධ්‍යයනය කිරීමේ දී වැදගත් වන තවත් වටිනා චරිතයකි, ක්‍රි.ව. 12 වන සියවසේ විසූ ඡිනුල් (Chinul) හිමියන්. උන්වහන්සේ කොරියානු බුදු සමයේ හොඳම බෞද්ධ ප්‍රතිසංස්කරණවාදියා නැතහොත් හොඳම බෞද්ධ සාමග්‍රිකාරකයා වශයෙන් සම්භාවනාවට පාත්‍ර වෙති. එකළොස්වන වියේදී විහාරස්ථානයට යන මොහු පසළොස්වන වියේදී පැවිද්ද ලබයි. ඡිනුල් හිමියන්ගේ ආචාර්යවරයා වූයේ සෝන් භික්ෂුවකි. තමන් පැවිදි කළ ගුරුවරයා සමඟ කිට්ටු සම්බන්ධයක් නොමැති වූ ඡිනුල් හිමියන්ට හරිහමන් ගුරුවරයෙකු නොමැත. එම නිසා තමන්ට ස්වාධීනව ධර්මය හැදෑරීමට සිදු විය. ඡිනුල් හිමියන් හා කොරියානු සෝන් බුදු දහම ගැන මෑතකදී මුද්‍රණද්වාරයෙන් එළිදැක්වුණු අගනා කෘතියකි, *The Korean Approach to Zen The Collected Works of Chinul*. එහි ඡිනුල් හිමියන් විසින් රචිත ලේඛන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර තිබේ. එසේම අගනා හැඳින්වීමක් (Introduction) ද සපයා තිබේ. මෙම ග්‍රන්ථයේ

කර්තෘවරයා වන්නේ දැනට ඇමෙරිකාවේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ (UCLA) බෞද්ධ අධ්‍යයන අංශයේ මහාචාර්ය Robert E Buswell Jr. ය. එතුමා කොරියානු බුදු දහම පිළිබඳව පමණක් නොව සමස්ත බුදු දහම පිළිබඳ ප්‍රාමාණික උගතෙකු වශයෙන් ශාස්ත්‍රීය ලෝකය තුළ සම්භාවනාවට පාත්‍ර වී සිටියි. එම ග්‍රන්ථය 1983 හවායි විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලය මගින් මුද්‍රිතය. (Robert E Buswell, 1983)

1185 ඡිනුල් කොරියාවේ දකුණු පළාතේ තවත් කන්දක පිහිටි විහාරස්ථානයකට පැමිණියේය. ඉන් පෙන්නුම් කෙරෙන්නේ උන්වහන්සේ සංඝයා අතර පැවැති භේදය ගැන විශේෂ උනන්දුවක් දැක්වූ බව යි. එම භේදය ඉහතින් දැක්වූ පරිදි මෙසේ ය. එනම් ධර්මශාස්ත්‍රීය අධ්‍යාපනය අගය කළ භික්ෂූන් හා සෝන් (භාවනාව) අගය කළ භික්ෂූන් යන සංඝයා අතර පැවැති ද්විධ වූ වර්ගීකරණය යි. සෝන් හෙවත් භාවනාව සූත්‍ර ග්‍රන්ථයන්හි ද විද්‍යමාන බව ඡිනුල් හිමියන්ට ඒත්තු ගියේය. එමනිසා උන්වහන්සේ විවේකීව කඳුකරයේ වසමින් සූත්‍ර අධ්‍යයනය කරමින් භාවනාව හා සම්බන්ධ බුද්ධදේශනාවන් පරීක්ෂා කරමින් වාසය කළහ. දිනක් උන්වහන්සේට හ්වෝම් (හුවායෙන්) සම්ප්‍රදායට අයත් අවතංශක සූත්‍ර අටුවාව කියවීමෙන් මෙම අවබෝධය ඇතිවිය.

> "ධර්මය යනු ලෝකනාථයන් (බුදුරදු) වහන්සේ විසින් තම ශ්‍රී මුඛයෙන් දේශනා කරන ලද්දකි. සෝන් (භාවනාව) යනු පූර්වාචාර්යවරුන් විසින් සිය මනසින් සම්ප්‍රේෂණය කරන ලද්දකි. ලෝකනාථයන් වහන්සේගේ ශ්‍රී මුඛය හා පූර්වාචාර්යවරුන්ගේ මනස් අනිවාර්යයෙන්ම පරස්පර නොවේ. එසේම සෝන් හා ක්යෝල් ධර්මශාස්ත්‍ර ළැදි (Sŏn and Kyol) ශිෂ්‍යයන් මූලික ධර්මග්‍රන්ථ ඉගෙනීමක් නොමැතිව, එසේම විවේකීව භාවනා කරමින් ප්‍රකෝපකාරී මතභේදයන්හි ඇලී ගැලී තම කාලය නාස්ති කර ගන්නේ ද?" (*Hwaŏmnon chŏryo-Preface*) (Donald W. Michel, 2002)

මෙය ඡිනුල් හිමියන්ගේ දෙවන අවබෝධය වශයෙන් සැලකේ. සෝන් හා ක්යෝල් (Sŏn and Kyol) දෙපිරිස අතර සමගියක්

ගොඩනැඟීම අවශ්‍ය බව මින් ප්‍රකට වේ. ක්ෂණික අවබෝධය හා අනුක්‍රමික අවබෝධය (භාවනා කිරීම) යන දෙකම ධර්මශාස්ත්‍ර ළැදි (Kyol) සම්ප්‍රදාය තුළ අනුගමනය කළ හැකි බව උන්වහන්සේගේ අදහස යි. ධර්මශාස්ත්‍ර ළැදි හ්වෝම් (Hwaŏm) නිකාය හා සෙසු නිකායයන් උපාය කෞශල්‍ය මගින් අවබෝධය ලැබිය හැකි බව පෙන්වා දී තිබේ. ජිනුල් සෝන් (ධ්‍යාන-භාවනා) නිකායික ආචාර්යවරයෙකු වුවත් උන්වහන්සේගේ ලේඛන තුළ සෝන් අත්දැකීම් විග්‍රහ කිරීම සඳහා (Kyol) ධර්මශාස්ත්‍රීය සංකල්ප සඳහන් කර තිබේ. එක් උදාහරණයක් වශයෙන් ජිනුල් හිමියන් තම (*Complete and Sudden Attainment of Buddhahood*) යන ග්‍රන්ථයේ 'හ්වෝම් (Hwaŏm) නිකාය ඉදිරිපත් කරන ධර්මධාතුවේ අන්‍යොන්‍ය අවබෝධය හා විනිවිදභාවය හා එසේත් නැතිනම් වොන්හ්යෝ (Wŏnhyo) ඉදිරිපත් කරන ධර්මකාය සෝන් නිකාය උගන්වන ක්ෂණික අවබෝධය තුළ අන්තර්ගත වීම පෙන්වාදිය හැකිය.

1190 ජිනුල් හා උන්වහන්සේගේ හිතවත් භික්ෂූන් වහන්සේලා එකතුව සමාධි හා ප්‍රඥා සමාජ සංවිධානයක් බිහි කරමින් ප්‍රතිසංස්කරණ ඇති කළහ. ඒවා මගින් සමාධි හා ප්‍රඥා වර්ධනය සඳහා කැපවුණු එසේම පරිසරයට ඇලුම් කළ ජනතාව ආකර්ෂණය කරගන්නා ලදී. 1197 වන විට මෙම සමාජ සංවිධානය විශාල සාමාජික සංඛ්‍යාවකින් හෙබි පුළුල් ව්‍යාපාරයක් බවට පත්විය. එම ව්‍යාපාරය කොතරම් දියුණු වූයේද කියතොත් එහි ප්‍රධාන මධ්‍යස්ථානය නගරයක් බඳු විශාල ජනකායක් සහිත ස්ථානයක් බවට පත්වූයේය. විශාල පිරිසක් සාමාජිකත්වය ගත් බැවින් ඒ සඳහා විශාල භූමිභාගයක් අවශ්‍ය වූයෙන් කොරියානු අර්ධද්වීපයේ නිරිතදිග පිහිටි කන්දක ෂෝග්යේ (Chogye) නමින් විහාරස්ථානයක් ගොඩනගන ලදී. ඉන්පසු ජිනුල්ගේ මෙම නව නිකාය ෂොග්යේ (Chogye) නමින් ප්‍රකට විය.

එම විහාරස්ථානයේ ඉතාමත් විවේකීව හා සාමකාමීව කලක් වාසය කළ ජිනුල් හිමිපාණන් වහන්සේ සුප්‍රකට සෝන් (ඡාන් ධ්‍යාන)

ආචාර්යවරයෙකු වූ තාහොයි (Ta-Hui-1089-1163) හිමියන්ගේ වාර්තාමය ලේඛනයක එක් ඡේදයක් කියවමින් සිටින අතර, තුන්වන අවබෝධය ලැබීය. ඒ මෙසේය.

> "(අවබෝධයට පෙර) මම තවමත් රාග හා දෘෂ්ටි පහ නොකෙළෙමි. එය යමක් මගේ හදවත හිර කරන්නාක් මෙනි. එසේම එය මා සතුරෙකු හා වාසය කරන්නාක් මෙනි. (අවබෝධයෙන් පසු) මාගේ හදවත කිසිවකින් බාධා නොකරනු ඇත. එසේම මම සතුරෙකු සමඟ කිසිදා නැවත වාසය නොකරමි. එම මොහොතින් පසු මම සුඛයෙන් වාසය කරමි" (*Pojo Kuksa pim Yŏng, Pulgyo t'ongsa*, III, 338, 9-12) (Donald W. Mitchel, 2002)

ඉහත සඳහන් කළ තා-හොයි (Ta-hui) හිමියෝ චීන ලින්චි ඡාන් සම්ප්‍රදායේ සුප්‍රකට භික්ෂුවකි. උන්වහන්සේ මෙම ඡාන් හෙවත් ධ්‍යාන (භාවනා) ජනප්‍රිය කරවීම සඳහා හුවා තෝ (Hua-tóu – කොරියන් Hwadu) ක්‍රමය සමාජගත කිරීමට ක්‍රියා කළහ. ජිනුල් හිමියන්ගේ තෙවන හෙවත් අවසාන අවබෝධය සඳහා මෙම ක්‍රමයෙන් යම් ආභාසයක් ලැබුණු බව සිතිය හැකිය. ඊට හේතුව මෙම හ්වාඩු (Hwadu) ක්‍රමය අනුගමනය කළ කොරියානු ප්‍රථම භික්ෂුව වූයේ ජිනුල් ය. වර්තමාන සෝන් සම්ප්‍රදායේ කේන්ද්‍රීය අධ්‍යයන වන්නේ ද ජිනුල් විසින් කොරියාවට හඳුන්වා දුන් මෙම ක්‍රමය යි. හ්වාඩු (Hwadu) යන යෙදුමේ සාහිත්‍යමය අර්ථය 'කථානායකයා' යනු යි (Head of Speech). එය කොන්ග් අන් කියමන්වල විවේචනාත්මක ආප්තෝපදේශ ප්‍රකාශයකි. කොරියන් බසින් කොන්ග් අන් (Kongan) යනුවෙන් ද, චීන බසින් කුන්ග් අන් (Kung an) යනුවෙන් ද, ජපන් බසින් කෝ ආන් (Kōan) යනුවෙන් ද මෙකී ආප්තෝපදේශ (සැඟවුණු අර්ථ සහිත කියමන්) හැඳින්වේ. කොරියන් කොන්ග් අන් කියමන් අතර ප්‍රකට වූවක් මෙසේ දැක්විය හැකිය.

> "වරෙක එක් භික්ෂූන් වහන්සේ නමක් ඡාවො ජූගෙන් මෙසේ ඇසීය. 'බල්ලෙකු තුළ බුද්ධ ස්වභාව තිබේද? නැද්ද?' එවිට

ෂාවො ජූගේ පිළිතුර වූයේ 'නැත' යනු යි."(Donald W. Mitchel, 2002)

මෙම සංවාදයට අනුව කොන්ග්අන් යනු ගුරුවරයා හා ගෝලයා අතර අදහස් හුවමාරුව වශයෙන් දැක්විය හැකිය. මෙහි හ්වාඩු (Hwadu) නම් 'නැත' යන්නයි. සෝන් (ධ්‍යාන-භාවනා) දෘෂ්ටිකෝණයෙන් බල්ලන් ඇතුළු සෑම සත්ත්වයෙකු තුළම බුද්ධ ස්වභාව විද්‍යමාන වේ. එසේ නම් ප්‍රශ්නය වන්නේ ෂාවෝජු 'නැත' යනුවෙන් පිළිතුරු දුන්නේ මන්ද? යන්න යි. මෙම පිළිතුර අවබෝධ කර ගැනීම සඳහා එය ප්‍රකාශ කළ මොහොතේම ෂාවෝජූගේ මනසට ප්‍රවිෂ්ට විය යුතුය. සෝන් අනුගාමිකයෙකුට තමන් භාවනා කරන විට, ඇවිදින විට, වැඩ කරන විට යනාදි ඕනෑම අවස්ථාවක හ්වාඩු ('නැත' යන ප්‍රකාශය) මගින් ෂාවෝජූගේ මනස විනිවිද දැකිය හැකිය. හ්වාඩු මෙහිදී එම කියමනෙහි පරස්පරතාව හා මනස වෙත අවධානය යොමු කරවන අතර, මනසේ සංකල්පීය ක්‍රියාකාරිත්වය නතර කරවයි. මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය කරමින් එම අවධානය මනසේ ගැඹුරටම ගෙන ගොස් කොන්ග්අන් කියමන් මගින් ජනිත කළ 'සැකය' පිළිබඳව ප්‍රශ්න කරයි. එමගින් හ්වාඩුව කෙරෙහි අවධානය වැඩි කරවයි. කෙනෙකු තම මනසේ සහජ ස්වභාව වෙත ළඟා වූ විට, එසේම එය ඔහු හා ෂාවෝජූ මනසින් අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ වූ විට අවබෝධය මනසින් මනසට සම්ප්‍රේෂණය කළ හැකිය.

හයවන ෂාන් ආචාර්යවරයාගේ වේදිකා සූත්‍රය කියවන විට එක් ඡේදයක් හමුවිය. එය මෙසේය.

> "තථතාවේ ස්වයංස්වභාව සිතුවිලි ජනනය කරයි. එහෙත් එය නොයෙකුත් ප්‍රතිබිම්බයන්ගෙන් දූෂිත වී නැත. සත්‍ය ස්වභාව හැමවිටම නිදහස් හා ස්වයංප්‍රභාස්වර ය." (Donald W. Mitchel. 2002)

මෙම අත්දැකීමෙන් පසු වේදිකා සූත්‍රය හා සෙසු සෝන් ආචාර්යවරයන්ගේ ලේඛනයන් කියවීම තවදුරටත් සිදු කළේය. උන්වහන්සේ බුද්ධ ස්වභාවයේ ප්‍රාරම්භක අවබෝධය ලබා සිටින බැවින් සම්පූර්ණ අවබෝධය සඳහා සමාධි හා ප්‍රඥා වර්ධනය අඛණ්ඩව සිදු

කළහ. මෙම මූලික අවබෝධය උන්වහන්සේගේ 'ක්ෂණික අවබෝධය හා අනුක්‍රමික ප්‍රතිපදාව (භාවනාව) පදනම් කරගත් ඉගැන්වීම සඳහා උන්වහන්සේට මග පෙන්වීය. එම ඉගැන්වීම් චීන ඡාන් ආචාර්යවරයෙකු වූ සුන්ග්මි (Tsung-mi -779-840) හිමියන්ගෙන් දායාද කරගන්නා ලදී.

කෙනෙකු තම ක්ෂණික අවබෝධයෙන් බුද්ධ ස්වභාවය සොයා ගනී. එම බුද්ධ ස්වභාව යනු පරිපූර්ණ බුද්ධත්වය ලැබීම උදෙසා කෙනෙකු තුළ සහජයෙන් තිබෙන හැකියාවය; කුශලතාවය ය.¯ එය ප්‍රඥාවක් නොවන අතර ගතික යථාර්ථයේ අවබෝධයක් පමණි. එම යථාර්ථය නම් තථාගත ගර්භ හෙවත් කලලය, හෙවත් පරිපූර්ණ බුද්ධත්වය යි. පරිපූර්ණ බුද්ධත්වය උදෙසා අනුක්‍රමික ප්‍රතිපදාවක් මගින් මෙකී ප්‍රාරම්භක අවබෝධය වර්ධනය කිරීම අවශ්‍ය වේ. එම අනුක්‍රමික ප්‍රතිපදාව සම්මා සංකල්ප, සම්මා වාචා හා සම්මා කම්මන්ත යන අංගයන්ගෙන් සමන්විත වේ. මෙම අනුක්‍රමික ප්‍රතිපදාවක අවශ්‍යතාව උන්වහන්සේ විසින් ලියන ලද *'Serects on Cultivating the Mind'* ග්‍රන්ථයෙන් ඉදිරිපත් කර තිබේ.

ජිනුල් මෙසේ අවබෝධයේ අවස්ථා තුනක් ලබා ගන්නා ලදී. එසේම උන්වහන්සේ විසින් තම ඉගෙනීම් හා සෝන් ක්‍රමවේදය දියුණු කරන ලදී. උන්වහන්සේගේ ජීවිතය හා ක්‍රියා සෝන් අත්දැකීම් විවරණය කර ගැනීමට උපකාර වූයේය. එසේම ඒවා කොරියානු සංඝ ශාසනයේ සමගියට ඉවහල් වූයේය. ජිනුල් හිමියන් විසින් ලියන ලද ග්‍රන්ථය වූයේ *The Essentials of Pure Land Practice* ය. කොර්යෝ රාජ්‍ය සමය තුළ එමගින් ශුද්ධභූමි බුදුසමය ගිහි ජනතාව අතර ජනප්‍රිය කෙරුණි. ජිනුල් හිමි ශුද්ධභූමි භක්තියට කොරියානු බුදුසමය තුළ වැදගත් කාර්යභාරයක් හිමිකර දුන්නේය. එසේම මෙම කොර්යෝ රාජ්‍ය සමය තුළ කොරියානු බෞද්ධ කලාව කෙරෙහි ද තදබල බලපෑමක් කළ අතර, රටපුරා වෙහෙර විහාර ද ගොඩනැගුණේ ය.

හ්‍යුජෝන්ග් (Hyujŏng) හිමි මෙම ජෝසෝන් රාජ්‍ය සමයේ ඉතා බලසම්පන්න භික්ෂුවක් වූයේය. උන්වහන්සේ ශාස්ත්‍රීය අධ්‍යයන (Kyol) නිකාය ඉගැන්වූ ඉගැන්වීම් ජිනුල් හිමියන් පුහුණු කළ ක්‍රමික භාවනා වැඩපිළිවෙළක් මගින් ක්ෂණික අවබෝධය ලැබිය හැකි බවට ප්‍රකාශ

කෙරෙන සෝන් ඉගැන්වීම් ක්‍රමය හා සම්මිශ්‍රණය කළහ. උන්වහන්සේගේ ආරාමික විභාගය අවසන් වූ පසු ශාස්ත්‍රීය අධ්‍යයන නිකායේ (Kyol) අධ්‍යක්ෂ පදවියට පත්වූයේය. පසුව සෝන් නිකායේ අධ්‍යක්ෂ පදවියට ද පත්වූයේය. උන්වහන්සේ විසින් *'Mirror for Meditation Studies.'* නමැති ග්‍රන්ථය රචනා කරන ලදී. (Pihi Marshall 1995)

ජපන් සෙන් බෞද්ධ මූලාශ්‍රය

ජපානයේ සෙන් බුදු දහමේ ආරම්භය සෝතොකු තයිෂි කුමරුගේ කාලය තෙක් දිවයන්නකි. බුදු දහම චීනයෙන් ජපානයට පැමිණෙන්නේ මෙම සොතොකු තයිෂි කුමරුන් ජීවත්වූ ක්‍රි.ව. 7 වන සියවසේය. එම කාලය තුළ ජපන් හොස්සෝ නිකායේ (යෝගාචාර) ආරම්භක දෝසෝ (Dosho) හිමියන් විසින් සෙන් ප්‍රාගුණ්‍යයන් චීනයෙන් ජපානයට ගෙනඑන ලද බව පිළිගැනේ. ජපානයේ සැයිචෝ (Saicho) හිමියෝ තෙන්දයි සම්ප්‍රදායේ ආරම්භකයා වූ අතර චීන ඡාන් ආචාර්යවරයෙකු යටතේ (සෙන්) ධ්‍යාන ක්‍රම අධ්‍යයනය කොට වැදගත් (සෙන්) භාවනා ක්‍රම නිර්මාණය කළහ. කෙසේ නමුත් සෙන් දහම නිසි පරිදි ජපානයේ ස්ථාපනය වන්නේ කමකුරා යුගයේ සිටය.

හෙකිගන්රොකු

සෙට්ෂෝ (Setcho) නමින් ජපන් බසින් හැඳින්වෙන චීන ජාතික යුන්මන් (Yunmen) හිමියෝ (980-1052) සියයක් කෝආන් (Koan) එකතු කර රචනාවක් කළහ. එය චීන බසින් බියෑන්-ලු (*Biyan Lu*) නමින් හැඳින්වේ. උන්වහන්සේ ශ්‍රේෂ්ඨ චීන ඡාන් බෞද්ධාචාර්යවරයෙකු වශයෙන් සම්භාවනාවට පාත්‍ර වූහ. චීන බසින් කුන්අන් (Kunan) නමින් හැඳින්වෙන මෙම ගැඹුරු කියමන් මුලින්ම නිර්මාණය වූයේ චීනයේ සුංග් රාජ්‍ය (Sung-dynasty – 960-1270) සමයේදීය. එම කියමන් හා ඒවාට ඉදිරිපත් කළ අර්ථ විවරණ ග්‍රන්ථ දෙකක් වශයෙන් දැනට ශේෂව පවතී. එහි මුල්ම කෘතිය හෙකිගන්රොකු (*Hekiganroku*) නමින් ද දෙවැන්න මුමොම් කන් (*Mumon Kan*) නමින් ද ජපන් බසින් හැඳින්වේ. මෙහි පළමුවැන්න දෙවැන්නට වඩා වසර සියයකට පෙර රචිතය. ශ්‍රේෂ්ඨ

කවියෙකු වූ චීන ජාතික සෙට්චෝ හිමියන් විසින් සම්පාදනය කරන ලද හෙකිගන්රොකු කෘතිය සෙට්ෂෝගේ ජුකෝ (Setcho's Juko) නමින් ද හැඳින්වේ. මෙහි ජු යනු කාව්‍යයය. කෝ යනු පැරණි කෝආන් යනුයි. ඒ අනුව එහි අදහස 'සෙට්ෂොගේ පැරණි කෝආන් කාව්‍යය ග්‍රන්ථය' වශයෙන් සිංහලට පරිවර්තනය කළ හැකිය.

මෙම සෙට්ෂෝ හිමියන්ගේ පද්‍යයන්ට ඊට වසර සියයකට පසු විසූ (1063-1135) චීන ජාතික එන්ගෝ (ජපන් බසින් Engo) හිමියන් විසින් අටුවා සම්පාදනය කරන ලදී. ඒවා ඉතාමත් සංක්ෂිප්තය. එහෙත් සෑම කාරණයක් සම්බන්ධයෙන්ම දීර්ඝ විවරණ සපයන ලදී. එසේම සෑම කාරණයකටම සංක්ෂිප්ත හැඳින්වීමක් ද එකතු කරන ලදී. එහෙයින් මෙම හෙකිගන්රොකු (*Hekiganroku*) ග්‍රන්ථය කර්තෘවරුන් දෙදෙනාගේම (Setcho සහ Engo) උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් ද සැලකේ. මෙම ග්‍රන්ථයේ නාමය එන්ගෝ හිමියන්ගේ කුටියේ එල්ලා තිබූ රේඛා චිත්‍රාක්ෂර ඛණ්ඩ දෙකකින් නිර්මාණය කර ගත්තක් බව පිළිගැනේ. එහි එක් අක්ෂරයකින් හෙකි (heki = blue) නිල්පාට ද, අනෙක් අක්ෂරයෙන් ගන් (gan = cliff or rock) පර්වතය ද (ගිරි), අන්වර්ථ වූ අතර රොකු (roku records) යන්නෙන් වාර්තා ද වේ. ඒ අනුව එම ග්‍රන්ථය ඉංග්‍රීසි බසට *Blue Cliff Records* යනුවෙන් පරිවර්තනය කර තිබේ. එම නාමය සිංහල බසට 'නීලගිරි වාර්තා' යනුවෙන් මා විසින් පරිවර්තනය කරන ලදී. එන්ගෝ හිමියන්ගේ උත්සාහය වූයේ සෙට්ෂො හිමියන්ගේ ග්‍රන්ථයට වඩාත් ප්‍රායෝගික හා බුද්ධිමය පසුබිමක් සපයාදීමයි.

එන්ගෝ හිමියන්ගේ කාලය වන විට (ඣාන්) සෙන් රූපාක්ෂර ග්‍රන්ථ නිර්මාණය නොකළ යුතු බවට තදබල පිළිගැනීමක් තිබුණි. සමහර විට එම මතය වර්තමානයේ දී ද දැකිය හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් එන්ගෝ හිමියන්ගේ අනුප්‍රාප්තිකයා යැයි කියාගත් දයිඑ (Daie – 1089-1163) හිමියන් විසින් එන්ගෝ හිමියන්ගේ මුල් ග්‍රන්ථය විනාශ කරන ලදී. පසුව ෂෝ-මෙයි-අන් (Cho-mei-An) හිමියන් විසින් එවකට සොයා ගත හැකි වූ සියලුම ඉපැරණි පිටපත් 1300 ක් පමණ ආශ්‍රයෙන් නැවතත්

එන්ගෝ හිමියන්ගේ මුල් කෘතිය හැකි පමණ සම්පාදනය කරන ලදී. වර්තමානයේ අප විසින් කියවන හෙකිගන්රොකු (*Hekiganroku*) ග්‍රන්ථය එම ෂෝ-මෙයි-අන් හිමියන් විසින් සම්පාදිත කෘතියයි.

මුමොන්කන්

මුමොන්කන්, හෙකිගන්රොකු ග්‍රන්ථයට පසුව රචිතය. එහෙත් එය බොහෝ විට මෙම ග්‍රන්ථ දෙකින් පළමුව යෙදේ. ඊට හේතුව එය හෙකිගන්රොකු ග්‍රන්ථයට වඩා ඉතාමත් කෙටි හා සරල වීම විය යුතුය. චීන බසින් *Wu-Men Kuan* නමින් ද ජපන් බසින් Mumonkan නමින් ද හැඳින්වෙන මෙම ග්‍රන්ථය චීන ජාතික *Wu-Wen-hui hai* හිමියන් විසින් රචනා කරන ලදී. උන්වහන්සේ ක්‍රි.ව. 1228 දී සෙන් ආචාර්යවරයෙකු වූ අතර ජපන් බසින් මුමොන්-ඉකායි (Mumon-Ekai) නමින් හැඳින්වේ. එහි කෝආන් කියමන් (48) හතළිස් අටක් එකතු කර රචිතය. එහි සෑම 'මුමොන්' (Mumon) එකකටම පද්‍යයක් හා අටුවා විවරණයක් සපයා ඇත. මෙම මුමොන් කන් ග්‍රන්ථය ඉංග්‍රීසි බසට *The Gateless Gate* නමින් පරිවර්තනය කර ඇත. එම නාමය සිංහල බසට 'දොරටු විරහිත දොරටුව' වශයෙන් පරිවර්තනය කළ හැකිය.

මෙම ග්‍රන්ථද්වය පිළිබඳ ඉංග්‍රීසි පරිවර්තන රාශියක්ම විද්‍යමාන වේ. ඒවා අතර 2005 දී කත්සුකි සෙකිද (Katsuki Sekida) විසින් *'Two Zen Classics, The Gateless Gate and The Blue Cliff Records*' යන නමින් කරන ලද පරිවර්තන කෘතිය වැදගත්ය. (Katsuki Sekida: 2005)

එයිසායි හිමියෝ ජපන් සෙන් බුදු දහම හා සෙන් බෞද්ධ සාහිත්‍ය අධ්‍යයනයේ දී වැදගත් වන තවත් ආචාර්යවරයෙකි (Eisai). ක්‍රි.ව. 1191 දී සොෆුකුජි (Shofuku-ji) සෙන් බෞද්ධ විහාරස්ථානය ගොඩනගන ලද්දේ උන්වහන්සේ විසින්ය. එසේම චීන ලින් චී ඡාන් සම්ප්‍රදායේ ජපන් ස්වරූපය වූ රින්සායි සෙන් සම්ප්‍රදායේ ආරම්භකයා වශයෙන් ද උන්වහන්සේ සැලකෙති. එයිසායි හිමියන් විසින් රචනා කරන ලද (1198) *'Propagation of Zen in Deffense of the Country*' කෘතිය සෙන් දහමට පක්ෂපාතී විය. එහි මනස හා මනසේ අපූර්වත්වය,

විශාලත්වය හා වටිනාකම මැනවින් ඉදිරිපත් කර තිබේ. එම ග්‍රන්ථය ජපන් බසින් *Kozēn Gokoku Ron* නමින් හැඳින්වේ. තවත් සුප්‍රකට ජපන් ආචාර්යවරයෙකු වශයෙන් දෝගෙන් (Dogen) හිමියන් සඳහන් කළ හැකිය. දකුණු කියෝතෝවට සංක්‍රමණය වූ උන්වහන්සේ එහි සෙන් බෞද්ධ භාවනා මධ්‍යස්ථානයක් ද පිහිට වූහ. එහි දී උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨතම කෘතිය වන සෝබෝගෙන්සෝ (*Shobogenzo – The Essence of The Buddha's True Dharma*) රචනා කිරීම ආරම්භ කළහ. උන්වහන්සේගේ ජීවිතයේ අවසාන කාලයේ මෙම ග්‍රන්ථය සම්පූර්ණ කළහ. මෙම ග්‍රන්ථයෙන් ප්‍රකාශ කෙරෙන්නේ එනම් කර්තෘවර දෝගෙන් හිමියන්ගේ අවබෝධය පිළිබඳ අත්දැකීම්ය. සෑම ජීවියෙකුගේම බුද්ධ ස්වභාව ඇති බව මින් ප්‍රකාශ කෙරේ.

නිගමනය

ඉහත විස්තර කළ පරිදි චීනයේ ඡාන් නමින් ආරම්භ වී, කොරියාවේ සෝන් නමින් ව්‍යාප්ත වී, ජපානයේ සෙන් නමින් වඩාත් සංවර්ධනය වූ මෙම සම්ප්‍රදාය හා ඉගැන්වීම් වටා එක්තරා මට්ටමක බෞද්ධ සාහිත්‍යය ග්‍රන්ථ රාශියක් රචනා වී ඇති බව පෙන්වාදිය හැකිය. මෙම ග්‍රන්ථ රචනා කළ කතුවරුන් හා ඔවුන්ගේ පසුබිම මෙහිදි සාකච්ඡාකරන ලදි. චීන කොරියන් හා ජපන් යන රටවල් තුනකම කතුවරුන් හා ග්‍රන්ථ සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීම සුළුපටු කාර්යයක් නොවන බව වටහා ගැනීම අපහසු නැත. එහෙයින් මෙබඳු ලිපියකට ප්‍රමාණවත් පරිදි එම කර්තෘවරුන් හා ඔවුන්ගේ කෘති මෙන්ම ඒවායේ අන්තර්ගතය විස්තර කෙරුණි. ඒ මගින් සෙන් බෞද්ධ භාවනාවේ හා එහි මූලාශ්‍රමය සංවර්ධනය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ

1. ධම්මජෝති හිමි, මැදවච්චියේ, *ජපන් බෞද්ධ ඉතිහාසය හා සම්ප්‍රදාය,* 'කමකුරා යුගයේ බුදු දහම' පරිච්ඡේදය, (නුගේගොඩ: සරසවි ප්‍රකාශන, 2016)
2. ධම්මජෝති හිමි, මැදවච්චියේ, *චීන බෞද්ධ ඉතිහාසය හා සම්ප්‍රදාය,* 'චීනයේම ප්‍රභවය ලත් සම්ප්‍රදාය හතර' පරිච්ඡේදය, (කළුගමුව: එතික ප්‍රකාශන, 2012)

3. Donald W. Mitchel, *Buddhism, Introducing the Buddhist Experience,* (Oxford: Oxford University Press, 2002)
4. Fang Li Tian, *Zhong guo Fojiao Zhexue Shuyi*,(*Chinese Buddhist Philosophy)* 'Essence of Chinese Buddhist Philosophy', Vol 1, (Beijing: Renmin University Press, 1997)
5. Fred Srum, 1985. *Chinese Buddhist Thought an Introduction*, 'Chinese Buddhist Philosophy', Donald H, Bishop, ed. 2001, Delhi: Motilal Banarisidass, P. 222.
6. Hong Xiu Pin and Sun Yiping, *Hui-Neng Pinchuan* (*Critical Biography of Hui-neng Shi*), (Nanjing: Nanjing Daxue Chubanshi, 1998)
7. Joseph Edkins. Rev, *Chinese Buddhism*, (London: Trabner and Co. Ltd, 1958),
8. Kalupahana, D.J., *Principles of Buddhist Psychology*, (New York: State University Press,1987)
9. Katsuki Sekida, Trans. *Two Zen Classics*, *The Galeless Gate and The Blue Cliff Records*, (Botson and London: Sambhala, 2005)
10. Lai Yong hai, *Zhong guo Fojiao Baika Quan Shu,* (*Encyclopeadia of Chinese Buddhism)*, Middle part (Shanghai: Shanghai Old Text Publication, 1984)
11. Lai Yong Hai, *Zhong Guo Fogiao Xing Lun* (*The Theory of Buddha – Nature in Chinese Buddhism*) (Beijing: Zhong Guo Qinnian Chubanshi, 1999)
12. Litvinsky, B.A., *Encyclopaedia of Buddhism*, Vol IV, Fascicle 1, ed. Jotiya Dhirasekara,'Central Asia'(Colombo: Government of Sri Lanka, 1979) P.53
13. Nanaponika and Heker., *Great Disciples of the Buddha*, (USA: Wisdom Publication, 2012)
14. Pihi Marshal, *Koryo Sŏn,(Buddhism and Korean Literature)*, (Honalulu: University Of Hawai Press,1995)
15. Red Pine., *Tang Jing* (හොයිනන්ගේ වේදිකා සූත්‍රය) *The Platform Sutra*, *The Zen Teaching of Hui – neng*, (USA: Wisdom Publication, 2000)

16. Ren Ji yu, *Zhong Guo Fojiao Shi*, Part 3, (*History of Chinese Buddhism*), (Beijing: Zhong Guo Shihai, Kexue chubanshi, 1985)
17. Rev. Joseph Edkins, *Chinese Buddhism*, (London: Trabner and Co. Ltd, 1958)
18. Robert E Buswell, *The Korean Approach to the Zen, The Collected Works of Chinul*, (Honalulu: Univesity of Hawaii Press, 1983)
19. Robert E. Buswell., "The ' Short-cut' Approach of k'an̠-hua Meditation; The Evolution of a Practical Subitism in Chinese Ch'an Buddhism", *Sudden and Gradual Awakening*, (Delhi: Motilal Banarisidass, 1991)
20. Suzuki, D. T., *The Laṅkāvatārasutra*, (Delhi: Motilal Banarisidass, 1999)
21. Wang Ru Tong, *Biqiu Chuan Xiaozhu*, (Beijing: Zhonghua Press, 2006)
22. Yin shun, *Zhong Guo Chan Zong shi*, (*History of Chinese Chan Tradition*) (Beijing: Jiang xi Renmin Chu banshi, 1990)